සඳුදා හමුව

සංවර්ධනය පමා වුණේ පටු දේශපාලනය නිසයි

කොළඹ මහ නගර සභාවට තේරී පත්වූ නව මන්ත්‍රීවරුන්ගේ මංගල රැස්වීම හෙටයි. ඒ සමගම නගර සභාවේ දැන් කෙරෙන කටයුතු ගැන ඇත්තේ ද පුළුල් කතිකාවකි. නගර සභා විපක්ෂ නායක මිලින්ද මොරගොඩ මහතා පවතින තත්ත්වය මෙසේ විග්‍රහ කරයි.

ප්‍රශ්නය: අලුතින් පත්වූ කොළඹ මහා නගර සභාවේ ප්‍රථම රැස්වීම හෙට (අඟහරුවාදා) පැවැත්වෙනවා. ස්ථාවර කමිටු පත් කරගැනීමයි හෙට තිබෙන ප්‍රධානම කාර්යය. නගර සභා පාලනයේ දී කමිටු ක්‍රමයේ ඇති වැදගත්කම පහදා දිය හැකි ද?

පිළිතුර: ඔව්. නගර සභා නීතිරීති අනුව ප්‍රධාන කමිටු 3ක් පත් කළ යුතුයි කියලා සඳහන් වෙනවා. මෙහි දී මූල්‍ය පාලනය පිළිබඳ කමිටුව ඉතා වැදගත්. නගරාධිපතිවරයා තමයි එහි සභාපති වන්නේ. මේ කමිටුව හැර තවත් කමිටු දෙකක් අනිවාර්යයෙන්ම පත් කළ යුතුය කියල නියම කරල තිබෙනවා. ඊට අමතරව තවත් අවශ්‍ය විෂයයන් සඳහා කමිටු පත් කරගත හැකියි. මෙවර කමිටු 16ක් පත් කරගන්න අවශ්‍ය කටයුතු කෙරෙන බව න්‍යාය පත්‍රයේ සඳහන්.

ප්‍රශ්නය: මේ කමිටු 16 පත් කරගන්නේ කොහොම ද?

පිළිතුර: කමිටුවකට සාමාජිකයන් 6 දෙනෙක් ඇතුළත්. නගර සභා මන්ත්‍රීතුමන්ලා 53 දෙනාගෙනුයි ඒ අය තෝරා ගන්නෙ. රහස් ඡන්දයෙන් තමයි ඒ තේරීම කෙරෙන්නෙත්.

ප්‍රශ්නය: නගර සභාවට මොකටද ස්ථාවර කමිටු. කොහොමද ඒ කමිටු වැඩ කරන්නෙ?

පිළිතුර: විවිධ විෂයයන් සම්බන්ධයෙන් පත් වන කමිටු හරහා තමයි සියලුම කටයුතු සිද්ධ වෙන්නෙ. මුදල් වැය කරන ඕනෑම කාරණයක් මුදල් කමිටුව මගින් අනුමත කරන්න ඕනෑ. කැළිකසළ බැහැර කිරීම, නිවාස සම්බන්ධව, වෙළෙඳපොළවල් සම්බන්ධව ආදී වශයෙන් තවත් කමිටු ගණනාවක්ම තිබෙනවා. ඒ ඒ විෂයයන් පාලනයවයි මෙම කමිටු ක්‍රියා කරන්නෙ.

ප්‍රශ්නය: නගර සභා ඡන්දය හමාර වුණාට දේශපාලන උණුසුම පහ වෙලා නැහැ. මහ ආණ්ඩුව සන්ධානයේ. නගර සභාව එක්සත් ජාතික පක්ෂයේ. වැඩ පටන් ගන්නත් කලින් නගර සභාවේ දේශපාලන අවුල් පටන් අරන් වගෙයි නේද පෙනෙන්නෙ?

පිළිතුර: ඒක ස්වාභාවිකයිනේ. දේශපාලනේ හැමදාම උණුසුම්. පළාත් පාලන ඡන්ද පනත අනුව වැඩිම ආසන ගණනක් දිනා ගන්න පක්ෂයට බෝනස් ආසන දෙකක් ලැබෙනවා. එහෙම වුණත් මේ පාර නගර සභා මැතිවරණයේදි එක්සත් ජාතික පක්ෂය මන්ත්‍රීන් 24ක් පත් වෙන කොට විරුද්ධ පක්ෂයේ පක්ෂ ගණනාවකට මන්ත්‍රී ආසන 29ක් ලැබුණා. එතකොට ඉතාම පැහැදිලිව පේනව බහුතරය තියෙන්නෙ විපක්ෂයේය කියල. අපිට ලැබුණේ ආසන 16යි. පසුව සහාය දෙන්න ආපු මන්ත්‍රීන් පිරිසත් සමග දැන් මන්ත්‍රී ධුර 22ක් අපට තිබෙනවා. ඊට අමතරව මනෝ ගනේෂන් මහත්මයට මන්ත්‍රී ධුර 6යි. ජනතා විමුක්ති පෙරමුණට මන්ත්‍රී ධුර 1යි. මේක ඉතාම සංකීර්ණ සංයුතියක්. ඒ නිසා තමයි මේ උණුසුම ඇති වෙලා තිබෙන්නේ.

ජනවරම - බහුතරය තිබෙන්නේ විපක්ෂයටයි

ප්‍රශ්නය: බහුතරය විපක්ෂයේ ඉන්නවය කිව්වට තාවම එකට ඉන්නෙ මන්ත්‍රීවරු 22යි නේද?

පිළිතුර: ඔව්. බහුතරය විපක්ෂයෙ වුණාට ඒ අය එක එක ආකාරයටයි පෙනී සිටින්නෙ. අප සමග ඉන්න 22 තමයි. නමුත් විපක්ෂයෙ අයිතීන් ලබා ගන්න අපි කවුරුත් එකට ක්‍රියා කළ යුතුයි.

ප්‍රශ්නය: නගර සභාවේ පාලනය ආරම්භ කරන්නත් කලින් විපක්ෂය නගර සභාවේ කාමර බලෙන් අල්ලා ගත් බව පුරපතිවරයා චෝදනා කර තිබුණා?

පිළිතුර: ඒක සම්පූර්ණ අසත්‍යයක්. සත්‍ය දැන දැන බොරු කියන්න හොඳ නැහැ. බලෙන් අපි කාමර ගන්නෙ නැහැ.

ප්‍රශ්නය: එහෙනම් කොහොමද ඔබේ කණ්ඩායමට නගර සභාවෙ කාමර ලැබුණේ?

පිළිතුර: මුලින්ම කියන්න ඕන එක්සත් ජාතික පක්ෂයට මා සමගවත් සුහදව නම්‍යශීලීව ක්‍රියා කරන්න බැරි නම් වෙන කා එක්කවත් ක්‍රියා කරන්න අමාරු වේවි. පොලිසියට යන්න කලින් එයාලට තිබුණ මාත් සමග සාකච්ඡා කරන්න. නගර සභා පාලනයට උපදෙස් දෙන අය තත්ත්වය විකෘති කරන්න උත්සාහ කරන්න ඇති.

ප්‍රශ්නය: නගර සභාවේ කාමර ඔබේ මන්ත්‍රීන් විසින් අල්ලාගත් බවට නැගෙන චෝදනාව ගැන පිළිතුරු දෙන්න?

පිළිතුර: බහුතර මන්ත්‍රී පිරිසක් විපක්ෂයෙ ඉන්න කොට ඒ අයට රැස්වෙන්න තැනක් ඕන. ඒ බව විපක්ෂයේ මන්ත්‍රීතුමන්ල මට දැනුම් දුන්න. මනෝ ගනේෂන් මැතිතුමා පවා තමන්ට කාමර පහසුකම් හා කාර්ය මණ්ඩල පහසුකම් ඉල්ලා සිටිනවා. අපි මේක ඉල්ලන්නත් කලින් පුරපතිවරයා මාධ්‍යයට කියා තිබුණා විපක්ෂයට කාමර හිමි නැති බව. ඊට පස්සෙ අපි බලහත්කාරකම් කළේ නැහැ. නගර සභා පාලනය භාර බස්නාහිර පළාත් ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කළා අපේ කණ්ඩායමටත් රැස්වෙන්න නගර සභාවේ ස්ථානයක් ලබා දෙන්න කියල. අන්තිමට පළාත් පාලන කොමසාරිස් හා නාගරික කොමසාරිස්වරිය හරහා අපට කාමර දෙකක් වෙන් කර දුන්නා. අපි යතුරු බලෙන් ගත්තේ නැහැ. අපට ඒ නිලධාරීන් යතුරු ගෙනත් දුන්නා. පස්සේ ඒ කාමර නගරාධිපතිවරයාගේ හිතවතුන් විසින් අගුල් දැමීමෙන් පසුවයි නීති මාර්ගයට පොලිසියට ගොස් ප්‍රශ්නය විසඳා ගත්තෙ. මේ ගැන පුරපතිවරයා කියන කතාව සත්‍ය නොවෙයි. මහ ඇමැතිතුමා සම්පූර්ණ සත්‍ය සිද්ධිය දන්නවා.

දැන් තිබෙන ස්ථාවර නියෝග අවුරුදු 50කට වඩා පැරණියි. ඒ නිසා ඒවා වෙනස් විය යුතු බව මම හිතනව. ස්ථාවර නියෝග වෙනස් කළ යුත්තේ සංකීර්ණ ක්‍රමයකට. මහ ආණ්ඩුව පාර්ලිමේන්තු පනතක් මගින් තමයි ඒක කරන්න ඕනෑ. නගර සභාවෙත් නීති සම්බන්ධව වෙනම කමිටුවක් තියෙනව. ඒ නිසා පැරණි නීති රීති වෙනස් කළ යුතුද කියල එතනදිත් සලකා බලන්න පුළුවනි.

ප්‍රශ්නය: දැන් කාමර ප්‍රශ්නය ඉවර ද?

පිළිතුර: ඔව්. අපිට කාමරයක් ලබා දීමට නගරාධිපතිවරයා අවසානයේ එකඟ වුණා. ඕක මුලින්ම කළා නම් ඉවරනේ. එතුමා නිතරම කියනව ජන වරමට ගරු කළ යුතු බව. අද එහෙම බලනව නම් විපක්ෂයෙයි බහුතරය ඉන්නෙ. ජන වරම තිබෙන්නෙ එතැනයි. විපක්ෂයේ ඉන්න මන්ත්‍රීන් 29 දෙනාට රැස්වීමට කාමරයක් ඉල්ලා සිටීම ප්‍රජාතන්ත්‍ර විරෝධී ද? නීති විරෝධී ද? කොළඹ ජනතාව ඇත්ත තේරුම් ගනීවි. මෙතනදී මම හෝ මගේ කණ්ඩායමේ මන්ත්‍රීතුමන්ලා කිසිම නීති විරෝධී කටයුත්තක් නොකළ බව වගකීමෙන් කියන්න ඕනෑ.

ප්‍රශ්නය: නගර සභාවේ කටයුතු ආරම්භ වෙන්නත් කලින් ප්‍රධාන පක්ෂ අතර මේ වගේ ආරවුලක් ඇති වෙන්න වෙනත් හේතු බලපෑව ද?

පිළිතුර: එහෙම වෙන්න පුළුවන්. මම හිතන්නෙ එක්සත් ජාතික පක්ෂය තමන්ගේ අභ්‍යන්තර දේශපාලන ප්‍රශ්න විසඳා ගැනීම සඳහා කොළඹ නගර සභාව උපයෝගි කරගන්නවා වෙන්න පුළුවනි. අපිට මේ අර්බුදවලට ඇතුළු වෙන්න අවශ්‍ය නැහැ. අපි බලන්නෙ මැතිවරණ කාලෙදී ජනතාවට දුන් පොරොන්දු ඉටු කළ හැකි මගක්. ඡන්දය කාලෙ අපි බොහෝ ප්‍රශ්න හඳුනා ගත්තා. අපි විපක්ෂයෙ හිටියත් මහ ආණ්ඩුව සන්ධානයේ තිබෙන නිසා අපට ජනතාවට සේවය කරන්නට පිළිවනි. එහෙත් එක්සත් ජාතික පක්ෂය තමන්ගේ ප්‍රශ්න විසඳා ගන්න කොළඹ මහා නගර සභාවෙන් සටන් පාඨ ගෙන යනව වගෙයි පේන්නෙ. ඒකෙන් ජනතාවට වෙන යහපතක් නැහැ.

ප්‍රශ්නය: ඔබ මැතිවරණ කාලෙත් කිව්ව කොළඹ නගරය දේශපාලන පාපන්දුවක් කරන්න එපා කියල. එහෙත් දැන් ඒක වෙලා නේද?

පිළිතුර: ඔව්. මම කිව්ව කොළඹ දේශපාලනය පාපන්දු ක්‍රීඩාවක් කරන්න එපා කියල. හැමදාම සංවර්ධනය පමා වුණේ ඔය පටු දේශපාලනේ හින්දයි. දැන් ඡන්දය ඉවරයි. නගර සභා පාලක පක්ෂයත් විපක්ෂයත් කළ යුත්තේ නාගරික සංවර්ධනය ගැන එකමුතුව කල්පනා කිරීමයි. අසත්‍ය තොරතුරු ප්‍රචාරය කිරීමෙන් නාගරික ප්‍රශ්න විසඳන්න බැහැ. ජනතාවට ඒවායින් වැඩකුත් නැහැ. මේ කාමර ප්‍රශ්නය පවා සම්පූර්ණ අනවශ්‍ය ප්‍රශ්නයක්. ඒක නිර්මාණය කළේ පාලක පක්ෂයයි. මම හිතනව අලුත් නගරාධිපතිතුමන් නගරයට වෙනසක් කරන්න කැමතියි කියල. ඒ නිසා නාගරික සංවර්ධනය ඉලක්ක කරගත් ගමනකුයි අප යා යුත්තේ. ජාතික දේශපාලන සටන් පාඨ නගර සභාවට ගේන්නෙ නැතුව වැඩ කළොත් අපිට යමක් කරන්න පුළුවන් වේවි.



කොළඹ මහ නගර සභා විපක්ෂ නායක,
ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක
මිලින්ද මොරගොඩ

ජාතික දේශපාලන සටන් පාඨ නගර සභාවට ගේන්න එපා

ප්‍රශ්නය: එක්සත් ජනතා නිදහස් සන්ධානයත් මනෝ ගනේෂන් කණ්ඩායමත් නාගරික සංවර්ධන කමිටුවල බහුතර සාමාජිකයන් තම පක්ෂවලින් පත්විය යුතු බව නගරාධිපතිතුමාට ලියා දැන්වූවා. මොකක්ද ඔහුගේ ප්‍රතිචාරය?

පිළිතුර: තවමත් කිසිම ප්‍රතිචාරයක් දන්වල නැහැ.

ප්‍රශ්නය: ඔහුගෙන් ප්‍රතිචාර නැත්නම් රහස් ඡන්දයට ගොස් කමිටු බලය අල්ලන්න පුළුවන් යැයි සිතනවා ද?

පිළිතුර: අපි යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඉතින් කමිටු තෝරන්නෙ රහස් ඡන්දයෙන්. හැමෝම බලන්නෙ ඡන්දය ජයග්‍රහණය කරන්නයි. අපි බලමු එදාට.

ප්‍රශ්නය: නගර සභා බලය නැතත් මහ ආණ්ඩුවේ සහය ලබාගෙන මැතිවරණ කාලයේ ජනතාවට දුන් පොරොන්දු ඉටු කිරීමේ සැලැසුමක් නැත් ද?

පිළිතුර: අපි හැකි උත්සාහයක් දරනව. අපට නගර සභාවේ විධායක බලයක් නැහැ. විරුද්ධ පක්ෂය කියන්නෙ හැම දේටම විරුද්ධ වන කණ්ඩායම නොවෙයි කියලා ජනාධිපතිතුමත් කිව්ව. මමත් එහෙම හිතනව. අපිට යුතුකමක් තිබෙන්නේ සාධාරණ දේට සහය දීමත්, අසාධාරණ දේ පෙන්වා දී විකල්ප ඉදිරිපත් කිරීමත් තමයි. නමුත් පටන් ගන්න කොටම සිදු වුනේ අවාසනාවන්ත සිදු වීමක්.

ප්‍රශ්නය: ආරක්ෂක ලේකම්තුමා ගත වූ වසර එකහමාරක කාලය තුළ නගරය සංවර්ධනය කරන්න වැඩ කළා. ඒ කටයුතුත් ඉදිරියට යාවි ද?

පිළිතුර: ඔව්. නාගරික නිවාස ප්‍රශ්නය විසඳීම, නගරය අලංකාර කිරීම, මාර්ග පදික වේදිකා හැදීම, උද්‍යාන හා බේරේ වැව ප්‍රදේශය සංවර්ධනය, උතුරු කොළඹ හා මැද කොළඹ විවිධ සංවර්ධන කටයුතුවලට ගෝඨාභය රාජපක්ෂ මහත්මය නායකත්වය දුන්නා. ඒ වැඩ දිගටම ඉදිරියට යනව. අපිටත් පුළුවනි ඒ කටයුතුවලදී නගර සභාව හා රජය අතර පාලමක් වෙන්න. ගෝඨාභය මහත්මය කරන වැඩ කොටස අපි අගය කරනව. ලෝක බැංකුවෙන් ජ්‍යෙෂ්ඨ නියෝජිත පිරිසක් ගිය සතියෙත් ඇවිල්ල හිටිය කොළඹ සංවර්ධන කටයුතු ගැන හොයා බලල උදව් කරන්න. ලෝක බැංකු උප සභාපතිනියකුත් ආව. ඒ අය මේ නගරයේ සංවර්ධනය ගැන ව්‍යාපෘති රැසකට උදව් දෙන්න පොරොන්දු වුණා. කරපු වැඩ ගැනත් ප්‍රශංසා කළා.

කොළඹ ජනතාව ඇත්ත තේරුම් ගනීවි

ප්‍රශ්නය: නාගරික සංවර්ධනය සඳහා වන ස්ථාවර කමිටුවල බහුතර බලය විපක්ෂයට ලැබුණොත් එයින් ඔබලාගේ වැඩපිළිවෙළට ලැබෙන අනුග්‍රහය කුමක් ද?

පිළිතුර: ඒ කමිටු හරහා තමයි නගර සභාවෙ බොහෝ වැඩ කටයුතු සැලසුම් වෙන්නෙ. ඒක හරියට 1931 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ විධායක කාරක සභා වගෙයි. හැම පක්ෂයක්ම මේ කමිටුවල ඉන්නව. බහුතරයටයි තීරණ ගන්න ලැබෙන්නෙ. අපේ කණ්ඩායමෙත් දක්ෂ පක්ෂකම් ඇති ජ්‍යෙෂ්ඨයන් පිරිසක් ඉන්නව. ඒ අයගෙන් වැඩ ගන්න පාලක පක්ෂය දැන ගත යුතුයි. මායිම් හරියට හඳා ගන්නෙ නැතුව අසාධාරණ ලෙස හැසිරුණොත් කිසිම දෙයක් සාර්ථක වෙන්නෙ නැහැ.

ප්‍රශ්නය: පසුගිය මැතිවරණ කාලෙ තිබුණ ලොකුම ප්‍රශ්නය තමයි පැල්පත්වාසීන් නගරයෙන් ඉවත් කරනවාද නැත්ද කියන ප්‍රශ්නය. ආණ්ඩුව ඡන්දය පැරදුන නිසා පැල්පත්වාසීන් ඉවත් කරන්නද යන්නෙ?

පිළිතුර: කිසිම දවසක ආණ්ඩුවෙ සැලැසුමක් තිබුණෙ නැහැ පැල්පත්වාසීන් නගරයෙන් ඉවත් කරන්න. අපි සැලැසුම් කළේ පැල්පත් මුඩුක්කුවල ඉන්න අන්ත අසරණ ජනතාවට ලක්ෂ 35ක් විතර වටිනා මහල් නිවාසයක් ලබා දෙන්නයි. ඡන්ද කාලෙ මේ කතාව කණපිට පෙරළල විපක්ෂය දේශපාලන වාසියක් ලබා ගන්නයි තැත් කළේ.

ප්‍රශ්නය: දැන් ඒ නිවාස වැඩපිළිවෙළ කෙරෙනව ද?

පිළිතුර: ඔව්. දැනටමත් නිවාස යෝජනා ක්‍රම හත අටක්ම ඉදිකිරීම් පටන් අරන් තිබෙනව. තමන්ගේ පරිසරයේම මහල් නිවාස ලබාදෙන්නයි රජයේ සැලැසුම. මුලින් නිවස 17,500ක් පමණ හැදෙනව. ඡන්ද ප්‍රතිඵලය මොනව වුණත් ඒ නිවාස ඉදිකිරීම් කරල ජනතාවට නිවාස ලබාදීමට අවශ්‍ය පියවර ගන්නව. ඒක ජනාධිපතිතුමාගේ උපදෙස් මත ආරක්ෂක ලේකම්තුමා කරන කටයුත්තක්. අපි ඒකට උපරිම සහය ලබාදෙනවා.

ප්‍රශ්නය: ආණ්ඩුව කරනව වගේ මහා නගර සභාවටත් තමන්ගේ නව සංවර්ධන යෝජනා ක්‍රම දියත් කරන්නට පුළුවනි. නගර සභාවෙ බහුතරය ඉන්නෙ විපක්ෂයෙනේ. ඔබලාගේ ප්‍රතිපත්තියට වෙනස් ප්‍රතිපත්තියක් ඔස්සේ නගරාධිපතිවරයා නාගරික සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කළොත් එතනදී මොකද කරන්නෙ?

පිළිතුර: ඉස්සරවෙලා නගරාධිපතිවරයා තමන්ගේ යෝජනා ඉදිරිපත් කරන්න ඕනෑ. එතකොට අපිට ඒ වගේ හොඳ නරක බලන්න පුළුවනි. විකල්ප යෝජනා දෙන්නත් පුළුවනි. මේ ස්ථාවර කොමිටි ක්‍රමයේ තිබෙන වාසිය ඒක තමයි. සිරිත් වශයෙන් නගර සභාව රැස් වෙන්නෙ මාසයකට වතාවයිනේ.

ප්‍රශ්නය: නගර සභාව දැනටත් ක්‍රියාත්මක වන්නේ 1955 හැදූ ස්ථාවර නියෝග මත. ඒවා වෙනස් කරගන්න අවශ්‍ය නැත්ද?

පිළිතුර: දැන් තිබෙන ස්ථාවර නියෝග අවුරුදු 50කට වඩා පැරණියි. ඒ නිසා ඒවා වෙනස් විය යුතු බව මම හිතනව. ස්ථාවර නියෝග වෙනස් කළ යුත්තේ සංකීර්ණ ක්‍රමයකට. මහ ආණ්ඩුව පාර්ලිමේන්තු පනතක් මගින් තමයි ඒක කරන්න ඕනෑ. නගර සභාවෙත් නීති සම්බන්ධව වෙනම කමිටුවක් තියෙනව. ඒ නිසා පැරණි නීති රීති වෙනස් කළ යුතුද කියල එතනදිත් සලකා බලන්න පුළුවනි.

ප්‍රශ්නය: නගර සභාවෙ එක්සත් ජනතා නිදහස් සන්ධානයට හිතවත් කණ්ඩායම පුළුල් කරගන්න අදහසක් නැත්ද? ඒ කියන්නෙ පාලක පක්ෂයේ මන්ත්‍රී ධුර 24න් ඔබ්බට ආසන සංඛ්‍යාවක් අත්පත් කරගන්න?

පිළිතුර: අපි මේ විදියට යමු. මනෝ ගනේෂන් මහත්මයත් තමන්ගේ ස්ථාවරය තරමක් ප්‍රකාශ කරල තිබෙනව. කමිටු පත් කිරීමේ දී විපක්ෂයට බහුතරය ඕන කියල එතුමත් කියනව. තිබෙන මන්ත්‍රී සංයුතිය අනුව කොළඹ මහා නගර සභාව ඉදිරියට යා යුත්තේ ඉතාමත්ම සීරුවෙන්. කිසිම කෙනෙකුට තනියම රජ වෙන්න බැහැ.

සටහන
රන්ජිත් ආනන්ද ජයසිංහ